සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 7 - ශ්‍රේණිය
## චිත්‍ර කලාව

නම/විභාග අංකය :- ..........................................................  කාලය: පැය 02යි.

<u>සැලකිය යුතුයි.</u>

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

### <u>I කොටස</u>

- අංක 01 සිට 05 දක්වා ප්‍රශ්න සඳහා මෙම රූප සටහන ඇසුරින් පිළිතුරු සපයන්න.



1. මෙහි දක්වා ඇති කලා කර්මාන්තය කුමක්ද?
2. එම කලා කර්මාන්ත වඩාත් ප්‍රචලිත ප්‍රදේශය කුමක්ද?
3. මේ සඳහා යොදාගනු ලබන ගීත මොනවාද?
4. රූපවාහිනී මාධ්‍ය තුල ඉතා ජනප්‍රිය වී ඇති මෙම කලා කෘති වර්ග මොනවාද?
5. මෙම ප්‍රාසාංගික කලාවේ වේදිකාව සකස් කරන්නේ කෙසේද?

- **ප්‍රශ්න අංක 6 සිට 10 වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

6. තැඹිලි වර්ණය
   i. මූලික වර්ණයකි  ii. විසංගත වර්ණයකි
   iii. ද්විතියික වර්ණයකි  iv. අපක්ෂපාතී වර්ණයකි.

7. ඇඹීම් ශිල්ප ක්‍රමය සඳහා වඩාත් සුදුසුම මාධ්‍යය වන්නේ
   i. සිමෙන්ති  ii. මැටි
   iii. සබන්  iv. ගල්

8. චිත්ත රෙද්දක් නිර්මාණය සඳහා වඩාත් සුදුසු මෝස්තර වර්ගය වන්නේ
   i. වෘත්තාකාර මෝස්තර
   ii. මුළුතල මෝස්තර
   iii. ව්‍යාප්ත මෝස්තර
   iv. වාටි මෝස්තර

9. අක්ෂරකරණය අයත් චිත්‍ර වර්ගය වන්නේ
   i. ග්‍රැපික්
   ii. සංරචන
   iii. මෝස්තර
   iv. මූර්ති

10. කොලාජ් චිත්‍රයක මූලික මාධ්‍ය වන්නේ
   i. දියසායම්
   ii. පැස්ටල්
   iii. ප්ලැටිග්නම්
   iv. කඩදාසි

- අංක 11 සිට 15 දක්වා දී ඇති වගන්ති නිවැරදි නම් (✓) ලකුණද, වරදි නම් (✗) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන තුල යොදන්න

11. අරළු, බුළු කොටා තම්බා ගැනීමෙන් කොළ වර්ණය සාදා ගත හැකිය (............)


12. කාටුන් චිත්‍ර වල හාස්‍ය හා විශ්මය මතු කිරීමට මන්දගාමී හා අධිවේගී චලන භාවිතා කෙරේ. (............)

13. රෝස් වින්ඩෝ (Rose window)නම් ගෘහ නිර්මාණ අංගය කිතුණු ගොතික් ක්‍රමයේ දේවස්ථාන වල දක්නට ඇත. (............)

14. කදීර්පායි යනු උත්සව පැදුරු වර්ගයකි. (............)

15. ලජ්ජිතිස්ස රජතුමා විසින් මුල්ම වටදාගෙය ඉදිකර ඇත. (............)

- **ප්‍රශ්න අංක 16 - 20 දක්වා පහත දක්වෙන රූප සටහන් උපයෝගී කර ගනිමින් පිළිතුරු සපයන්න.**

| **A** | **B** | **C** | **D** | **E** |
|---|---|---|---|---|
|  |  |  |  |  |

16. ප්‍රාග් ඓතිහාසික සිතුවම් ...................................... රූප සටහනින් දක්වේ.

17. A රූප සටහනින් දක්වෙනුයේ ...................................... නම් වූ සිංහල සැරසිලි මෝස්තරයයි.

18. .................................. නම් වූ කාටුන් වැඩසටහන E අක්ෂරයෙන් දක්වේ.

19. .................................. චෛත්‍ය හැඩය C රූප සටහනින් දක්වේ.

20. D රූප සටනින් දක්වෙනුයේ .................................. තුල ඇති රූපාක්ෂර විශේෂයකි.

● අංක 21 සිට 25 දක්වා දී ඇති වචනය සම්බන්ධ වචනය වරහන තුළින් තෝරා හිස්තැන් පුරවන්න.

( පන් පැදුරු කර්මාන්තයට අයත් සැරසිල්ලකි, ලී කැටයම් හි දක්නට ලැබේ, මිනිස් රූප සම්පිණ්ඩනයක් දැකිය හැක, මහසෙන් රජුගේ නිර්මාණයකි, තල් කොල මාධ්‍ය පෙට්ටි විශේෂයකි)

21. උඟවල් ..................................................................................................................................

22. රත්වත්තේ අලංකාරය ...............................................................................................................

23. ජේතවන දාගැබ ......................................................................................................................

24. බිල්ලෑව ................................................................................................................................

25. කඩුපුල් මල ...........................................................................................................................

● පහත රූපය හඳුනාගෙන අංක 26 සිට 30 දක්වා ප්‍රශ්න සඳහා දී ඇති තේමා අනුව කෙටි වාක්‍ය ලියන්න.



26. චෛත්‍යයේ නම කුමක්ද? ..........................................................................................................

27. නිර්මාණය කළ රජතුමා කවුද? ...............................................................................................

28. කුමන යුගයට අයත්ද? .............................................................................................................

29. මෙහි ගර්භයේ හැඩය කුමක්ද? ................................................................................................

30. හතරැස් කොටුවේ ඇති සැරසිල්ල කුමක්ද? .................................................................................

## II කොටස

- ඔබ ඉදිරියේ තබා ඇති ද්‍රව්‍ය සමූහය පැන්සලෙන් පමණක් චිත්‍රණය කරන්න.
- ද්‍රව්‍ය වල ස්භාවය, එළිය අඳුර පර්යාවලෝකන ලක්ෂණ පෙනෙන සේ කොලයට සම්පින්ඩනය කර අඳින්න

## .III කොටස

- පහත දැක්වෙන එක් මාතෘකාවක් පමණක් තෝරාගෙන වර්ණවත් චිත්‍රයක් නිර්මාණය කරන්න.

1. ජනාකීර්ණ සති අග පොළක්
2. පිරිසර ගමක අසිරිය
3. වනයේ සැරිසරන මුව රංචුවක්
4. මල්, කොළ හා සත්වරූප හැඩතල ඇසුරින් මේස රෙද්දක්
5. ව්‍යුක්ත හඩ ඇසුරින් චීත්ත රෙද්දකට මෝස්තරයක්
6. අළුතින් ආරම්භ කරන වෙළඳ සැලකට නාමපුවරුවක්
7. ජ්‍යාමිතික සැරසිලි ආශ්‍රිත පොත් සළකුණක්

(ලකුණු 50)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது.
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

### 7 - ශ්‍රේණිය

### චිත්‍ර කලාව - II

කාලය - පැය ½

## ද්‍රව්‍ය බලා ඇඳීම


සිසුන්ට පැන්සලින් පමණක් චිත්‍රණය කිරීමට උපදෙස් ලබා දෙන්න.

ලබා දී ඇති ආදර්ශනය අනුව ද්‍රව්‍ය සම්පිණ්ඩනය සිදු කරන්න.

ද්‍රව්‍ය සමූහය ඇස් මට්ටමින් පහළ සිටින ලෙසත් කොළ / කොළ ඉත්ත ඇස් මට්ටමින් ඉහල සිටින ලෙසත් පිළියෙල කරන්න.

යෝජිත ද්‍රව්‍ය - (අවශ්‍ය නම් විකල්ප සපයා ගන්න.)

1. පෙට්ටියක් - උස 10 cm පළල 22 cm දිග 28 cm පමණ වන (මාරි බිස්කට් පෙට්ටියක්)
2. වොලි බෝලයක්
3. ටින් එකක් (1L ඉමල්ෂන් ටින් එකක් හෝ විකල්පයක්)
4. ඇන්තූරියම් කොළ 2 ක් හා මලක්
5. ධාරකයක්



සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது.
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 7 - ශ්‍රේණිය
## චිත්‍ර කලාව පිළිතුරු පත්‍රය

**I පත්‍රය**

(01) රූකඩ කර්මාන්තය
(02) අම්බලන්ගොඩ
(03) නූර්ති/ නාඩගම් ගීත
(04) අත් රූකඩ, රිටි රූකඩ
(05) ඇස් මට්ටමින් ඉහළ කුඩා වේදිකාවක්
(06) ද්විතියික වර්ණයකි
(07) මැටි
(08) ව්‍යාප්ත මෝස්තරයකි
(09) ග්‍රැෆික්
(10) කඩදාසි
(11) × (12) × (13) × (14) × (15) ×
(16) B (17) සීතමල (18) පිස්සු පූසා
(19) ආමලාකාර / ආම්ලාකාර / (20) මස්ජිදය / මුස්ලිම් දේවස්ථාන
(21) තල්කොල මාධ්‍ය පෙට්ටි විශේෂයකි.
(22) පන් පැදුරු කර්මාන්තය.
(23) මහසෙන් රජුගේ නිර්මාණයකි.
(24) මිනිස් රූප සම්පිණ්ඩනය.
(25) ලී කැටයම් හි දක්නට ලැබේ.
(26) මෙම චෛත්‍යය රන්කොත් වෙහෙර නම් වේ.
(27) නිශ්ශංකමල්ල රජු විසින් මෙය නිර්මාණය කර ඇත.
(28) මෙය පොළොන්නරු යුගයට අයත් වේ.
(29) ගර්භය බුබ්බුලාකාර හැඩයෙන් යුක්ත වේ.
(30) හතරැස් කොටුවේ අටපෙති නෙළුම් මල් සැරසිල්ලක් ඇත.